# 1. සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය හා විකාශය

**නිපුණතාව** : 1.0 සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය, විකාශය, එහි ශාස්ත්‍රීය පසුබිම හා ඉගෙනීමෙහි වැදගත්කම පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 1.1 ශාස්ත්‍රීය විෂයයක් ලෙස සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය, විකාශය හා ඉගෙනීමෙහි වැදගත්කම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- ශාස්ත්‍රීය විෂයයක් ලෙස සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය පිළිබඳ පැහැදිලි කරයි.
- සන්නිවේදන අධ්‍යයනයෙහි විකාශය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.
- සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයයක් ලෙස හැදෑරීමේ වැදගත්කම පැහැදිලි කරයි.

**හැඳින්වීම**

සන්නිවේදනය අත්‍යවශ්‍ය මානවීය ක්‍රියාවලියකි. පුද්ගල අන්තර් සම්බන්ධතා ගොඩනඟා ගැනීම සඳහා සෑම පුද්ගලයෙකුට ම සන්නිවේදනය අත්‍යවශ්‍ය වේ. සන්නිවේදනය යන්නෙහි සරල අර්ථය වන්නේ හැඟීම් දැනීම්, අදහස් සහ දැනුම යනාදිය හුවමාරු කර ගැනීම යි. ප්‍රාථමික සමාජවල විසූ මිනිසුන් විවිධ ශබ්ද, සංඥා, සංකේත භාවිතයෙන් කළ සරල අදහස් හුවමාරුවේ සිට වර්තමානය වන විට ජනමාධ්‍ය හා අංකිත සන්නිවේදන තාක්ෂණ මෙවලම් ඔස්සේ සිදු කරනු ලබන තොරතුරු හුවමාරුව දක්වා සන්නිවේදන ක්ෂේත්‍රය පුළුල් වී ඇත. නූතනයේ විශ්වය ම එක පවුලක් වන තරමට මානව අන්තර් සම්බන්ධතා සමීප කරවීමට සන්නිවේදනය හේතු වී තිබේ.

සන්නිවේදන ක්‍රියාවලියේ වර්ධනයත් සමග ජනමාධ්‍ය ඇතුළු විවිධ දියුණු සන්නිවේදන මෙවලම් ඔස්සේ සිදු වන අසීමාන්තික තොරතුරු ජනනය, හුවමාරුව හා ව්‍යාප්තිය තනි තනි පුද්ගලයාගේ මනස හා චර්යාව කෙරෙහිත් පුද්ගලයාගේ සමාජීය අන්තර් සම්බන්ධතා කෙරෙහිත් අවසානයේ සමස්ත සමාජය කෙරෙහිත් ප්‍රබල බලපෑමක් ඇති කරයි. එය ඉෂ්ට මෙන් ම අනිෂ්ට බලපෑමක් විය හැකි ය. මාධ්‍ය ඔස්සේ අසීමාන්තික ව, විචිත්‍රවත් ආකෘති ඔස්සේ, ශීඝ්‍රයෙන් ගලා එන තොරතුරු පරිහරණය කිරීමෙන් තොර ව හුදෙකලා පුද්ගල ඒකක ලෙස සමාජයේ තනි ව කටයුතු කිරීමට සක්‍රිය පුරවැසියෙකුට නොහැකි ය.

එසේ ම පුද්ගලයා සමාජ ජීවියෙකු ලෙස තොරතුරු පරිහරණයෙන් වැළකී සිටීම හෝ ඔහු වළකා තැබීම කළ නොහැකි ය. පුද්ගලයාගේ හා සමාජයේ ප්‍රගමනයට අවශ්‍ය තොරතුරු ලබා ගත යුතු ය. මේ සඳහා අවශ්‍ය වන්නේ මාධ්‍ය ඔස්සේ ලබා දෙන තොරතුරු තෝරා බේරා ගෙන පරිහරණය කිරීමේ ඥානය යි. මාධ්‍යය විසින් මවනු ලබන මායාව හා යථාර්ථය වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමට ශක්තිය ඇති කරන පුද්ගලයාට අත්‍යවශ්‍ය වන මාධ්‍ය සාක්ෂරතා ඥානයෙන් සහ විචාරශීලී ග්‍රාහකයන් ලෙස කටයුතු කිරීමට අවශ්‍ය ඥානයෙන් ඔහු සන්නද්ධ විය යුතු ය.

යුනෙස්කෝ සංවිධානය 1982 වසරේ දී ගෲන්වල්ට් ප්‍රකාශනය විසින් එහි සමුළු වාර කිහිපයක දී ම මාධ්‍යයේ අහිතකර බලපෑමෙන් ළමා හා තරුණ පරපුර මුදවා ගත යුතු බව දක්වන ලදි. එහි දී මාධ්‍ය සාක්ෂරතාවෙන් හා විචාරශීලී ලෙස මාධ්‍ය පරිහරණය කිරීමේ ඥානයෙන් මෙන් ම නිර්මාණශීලී චින්තනයෙන් දරුවන් බලසම්පන්න කළ යුතු බව අවධාරණය කරන ලදි. පාසලේ ප්‍රාථමික ශ්‍රේණියේ සිට මාධ්‍ය අධ්‍යාපනය ලබා දිය යුතු බවට යුනෙස්කෝ සංවිධානය නිර්දේශ කර සිටියේ ද ඒ අනුව යි.

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් මාධ්‍ය සාක්ෂරතා ඥානයෙන් හා විචාරශීලී ව මාධ්‍ය පරිහරණය කිරීම පිළිබඳ අවබෝධයෙන් යුක්ත සක්‍රිය සන්නිවේදකයන් මෙන් ම පුරවැසියන් වීම අත්‍යවශ්‍ය ය. ඒ සඳහා මෙම විෂයයෙහි විෂය අන්තර්ගතය පෙළ ගස්වා ඇත. විෂය නිර්දේශයෙහි සංක්ෂිප්ත ව දක්වා තිබූ විෂය කරුණු මෙහි දී විස්තරාත්මක ව ඇතුළත් කර තිබේ.

සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයයක් ලෙස හැදෑරීම ආරම්භ වූ ආකාරය, එහි වර්ධනය, සන්නිවේදන විෂයය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියට හඳුන්වා දීම සහ විෂයය හැදෑරීමේ වැදගත්කම හා අවශ්‍යතාව පිළිබඳ අවබෝධය ලබා දීම මෙම ඒකකය මඟින් සිදු වේ. එමඟින් සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හැදෑරීමට අවශ්‍ය පදනම ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත ලබා දීම අපේක්ෂා කෙරේ.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න.

**සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය, විකාශය හා ඉගෙනීමෙහි වැදගත්කම**

- සන්නිවේදනයත් මානව අන්තර් සම්බන්ධතාවනුත් අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධතාවකි. මිනිසා මිහි මත ජීවත් වීම ආරම්භ කළ දිනයේ සිට මානව සන්නිවේදනය ක්‍රියාත්මක වේ.
- ප්‍රාථමික සමාජයන්හි විසූ ජනයා සිය සරල ජීවන අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා විවිධ සංඥා, ශබ්ද, සංකේත භාවිත කරමින් ආරම්භ කළ අදහස් ප්‍රකාශනය අද වන විට දියුණු සන්නිවේදන තාක්ෂණික මෙවලම් ඔස්සේ සිදු වන ඉතා සංකීර්ණ ක්‍රියාදාමයක් බවට පත් ව තිබේ.
- සන්නිවේදන තාක්ෂණයේ දියුණුව, ජනමාධ්‍යයන්ගේ වර්ධනය සහ මාධ්‍ය විසින් සමාජය වෙත කරන ලද බලපෑමේ ස්වභාවය සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය ස්වාධීන විෂයයක් ලෙස වැඩීමටත්, ගැඹුරින් අධ්‍යයනය කිරීමටත් ප්‍රධාන වශයෙන් හේතු විය.
- සන්නිවේදන අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ වන්නේ මානව අත්දැකීම්වල කේන්ද්‍රීය සාධකය ලෙස සන්නිවේදනය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ හැදෑරීම යි.
- මෙහි දී මානව අත්දැකීම් යන්නට සන්දේශ නිර්මාණය, හුවමාරු කර ගැනීම, ඒවා අර්ථකථනය කිරීමේ දී ජනතාව හැසිරෙන, ක්‍රියා කරන ආකාරය කෙසේ ද? යන්න අවබෝධ කර ගැනීම ඇතුළත් වේ.
- සන්නිවේදනය යන්න මිනිසාගේ ආරම්භය තෙක් දිවෙන ක්‍රියාවලියක් වුවත් එය ශාස්ත්‍රීය විෂය ක්ෂේත්‍රයක් ලෙස අධ්‍යයනය කිරීම කෙරෙහි ලෝකයේ අවධානය යොමු වන්නේ 20 වන සියවසේ මුල් භාගයේ දී ය.
- කාර්මික විප්ලවය, පළමුවන හා දෙවන ලෝක යුද්ධ හේතුවෙන් සන්නිවේදන තාක්ෂණයේ සිදු වූ ශීඝ්‍ර දියුණුව ජනමාධ්‍ය බිහි වීම, වර්ධනය හා ව්‍යාප්තිය කෙරෙහි බලපෑවේ ය. මෙම තත්ත්වය සන්නිවේදන විෂයය පිළිබඳ අධ්‍යයනය කිරීමේ උනන්දුව හා අවශ්‍යතාව ඉහළ නැංවී ය.

- ලෝක යුද්ධ අවසන් වීමෙන් පසු යුද්ධ තොරතුරු වාර්තා කිරීම හා හුවමාරු කිරීම සඳහා භාවිත කළ මාධ්‍ය ජනතාව වෙනුවෙන් විනෝදාස්වාදය හා තොරතුරු සම්පාදනය කිරීමට යොදා ගන්නා ලදි.

- යුද්ධයෙන් පීඩාවට පත් ව සිටි ජනතාවගේ බිඳ වැටුණු මානසිකත්වය ඉලක්ක කර ගනිමින් මාධ්‍ය ඔස්සේ සරල විනෝදය ගෙන දෙන ත්‍රාසය, භීතිය, වීරත්වය හා ලිංගිකත්වය මතු කරන ආකාරයේ ටෙලි නාට්‍ය, චිත්‍රපට, පුවත්පත්, ගීත ආදිය බහුල ලෙස විකාශනය කරනු ලැබිණ.

- මෙකල වාණිජ පරමාර්ථයෙන් මෙන් ම බලය ලබා ගැනීමේ හා තහවුරු කර ගැනීමේ අපේක්ෂාවෙන් ද මාධ්‍ය හිමිකරුවන් විසින් හා දේශපාලන නායකයන් විසින් අත්තනෝමතික ලෙස ජනමාධ්‍ය භාවිතයට ගනු ලැබිණ.

- මේ සෑම ආකාරයෙන් ම මාධ්‍ය මඟින් සමාජය වෙත එල්ල කළ තියුණු බලපෑම විසින් සන්නිවේදන ක්ෂේත්‍රය පිළිබඳ ශාස්ත්‍රීය වශයෙන් අධ්‍යයනය කිරීමට විද්වත්හු පොලඹවනු ලැබූහ.

- ඒ අනුව එක් දහස් නවසිය විසි ගණන්වල දී විවිධ විෂය ක්ෂේත්‍රයන්හි ශික්ෂණය ලබා තිබූ විශේෂඥ දැනුමෙන් යුතු විද්වත්හු ඔවුන්ගේ පර්යේෂණවල අනාවරණ මඟින් එවක ක්‍රියාත්මක වූ ජනමාධ්‍ය පුද්ගලයා කෙරෙහි හා පුද්ගල සමාජ සම්බන්ධතා කෙරෙහි බලපෑමක් ඇති කරන බව තහවුරු කළහ.

- සන්නිවේදන විෂයය "සන්නිවේදන අධ්‍යයනය" (Communication Studies) නමින් ස්වාධීන විෂය ක්ෂේත්‍රයක් ලෙස හැඳින්වීමට පෙර එය ප්‍රධාන විෂයයන් තුනක් වන මනෝවිද්‍යාව, සමාජ විද්‍යාව හා දේශපාලන විද්‍යාව යන ශික්ෂණවේදයන්හි අන්තර්ගත විය.

- සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයේ චාල්ස් හෝර්ටන් කූලී, දේශපාලන විද්‍යා ක්ෂේත්‍රයේ වෝල්ටර් ලිප්මාන් සහ අධ්‍යාපන විද්‍යා ක්ෂේත්‍රයේ ජෝන් ඩුවී යන විද්වතුන්ගේ අදහස් හා පර්යේෂණ අධ්‍යයන විසින් සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයයක් ලෙස වර්තමාන තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය පදනම සකස් කරනු ලැබිණ.


චාල්ස් කූලි (1864-1929)
Charles Horton Cooley


වෝල්ටර් ලිප්මාන් (1889-1974)
Walter Lippmann


ජෝන් ඩුවී (1859-1952)
John Dewey

- චාල්ස් කූලී '**සමාජ සංවිධානය**' (1909) කෘතිය ද වෝල්ටර් ලිප්මාන් '**ජනමතය**' කෘතිය (1922) ද ජෝන් ඩුවී '**ජනතාව හා ඔවුන්ගේ ගැටලු** '(1927) කෘතිය ද සම්පාදනය කරමින් දැක්වූ අදහස් සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය සංවර්ධනය කළේ ය.

- මානව සම්බන්ධතා පවත්වා ගැනීමේ හා වර්ධනය කිරීමේ යන්ත්‍රණය සන්නිවේදනය බව චාල්ස් කූලී විග්‍රහ කරන අතර මෙම විද්වත්හු තිදෙනා ම පුද්ගලයාගේ සමාජ ජීවිතයේ වැදගත් ම හා කේන්ද්‍රීය සාධකය සන්නිවේදනය ලෙස හඳුන්වා දෙති.

- වෙනස් වන හා දියුණු වන මාධ්‍ය තාක්ෂණය සංස්කෘතිය කෙරෙහි ඇති කරන බලපෑම සහ සන්නිවේදනය, ප්‍රජාතන්ත්‍රවාදය හා ප්‍රජාව යන කරුණු අතර ඇති සම්බන්ධතාවෙන් මතු වන සමාජ ගැටලු පිළිබඳ මෙම විද්වත්හු තව දුරටත් කරුණු ඉදිරිපත් කළහ. මෙම අදහස් සන්නිවේදනය ශාස්ත්‍රීය විෂයයක් ලෙස අධ්‍යයනය කිරීමට අවශ්‍ය පදනම සකස් කළේය.
- මෙයින් පසු සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයයක් ලෙස ස්ථාපනය වීම යුරෝපීය සහ අමෙරිකානු විද්වතුන් රැසකගේ පුරෝගාමීත්වයෙන් අමෙරිකාව කේන්ද්‍ර කර ගනිමින් සිදු ව ඇත. එහි දී සන්නිවේදන අධ්‍යයනය තව දුරටත් වෙනත් විෂයයන්හි අන්තර්ගත වූ විෂයයක් ලෙස නො ව ස්වාධීන විෂයය ක්ෂේත්‍රයක් ලෙස වර්ධනය වීම සිදු විය.
- 1933 වසරේ සිට 1945 පමණ දක්වා ජර්මනියේ ක්‍රියාත්මක වූ ඇඩොල්ෆ් හිට්ලර්ගේ ඒකාධිපති පාලනය යටතේ එරට විශ්වවිද්‍යාලවලින් පිටමං කරනු ලැබූ විද්වත්හු විශාල ප්‍රමාණයක් අමෙරිකා එක්සත් ජනපදයට සංක්‍රමණය වූහ. ඔවුහු අමෙරිකානු විශ්වවිද්‍යාල කේන්ද්‍ර කර ගනිමින් සන්නිවේදන ක්ෂේත්‍රය පිළිබඳ විවිධ ශාස්ත්‍රීය අධ්‍යයනයන්හි නිරත වූහ.
- හැරල්ඩ් ඩී. ලැස්වෙල්, කර්ට් ලෙවින්, පෝල් ලැසාස්ෆෙල්ඩ්, කාල් හව්ලන්ඩ්, විල්බර් ශ්‍රාම්, ජෝර්ජ් ගාබ්නර් වැනි විද්වතුන් විසින් ද ක්ලෝඩ් ශැනන් සහ වොරන් වීවර් යන ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයේ විද්වතුන් ද විසින් සන්නිවේදන අධ්‍යයනයෙහි ශාස්ත්‍රීය සංවර්ධනයට අවශ්‍ය පදනම සකස් කරන ලදි.


හැරල්ඩ් ඩී. ලැස්වෙල්
(1902-1978)
Harold D. Lasswell


කර්ට් ලෙවින්
(1890-1947)
Kurt Lewin


පෝල් එෆ්. ලැසාස්ෆෙල්ඩ්
(1901-1976)
Paul F. Lazarsfeld


කාර්ල් අයිවර් හව්ලන්ඩ්
(1912-1961)
Carl Iver Hoyland


විල්බර් ශ්‍රාම්
(1907-1987)
Wilber Schranm


ජෝර්ජ් ගාබ්නර්
(1919-2005)
George Gerbner


වොරන් වීවර්
(1894-1978)
Warren Weaver


ක්ලෝඩ් ශැනන්
(1916-2001)
Claude Shannon

- 1940 දශකයේ දී මහාචාර්ය විල්බර් ශ්‍රාම් විසින් සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂය ක්ෂේත්‍රයක් ලෙස ආයතන ගත කිරීමට පියවර ගන්නා ලදි. ඒ අතර ජනමාධ්‍ය පාසල්, සන්නිවේදන පර්යේෂණ ආයතන ස්ථාපිත කිරීම හා විශ්වවිද්‍යාලය සඳහා නව අධ්‍යයන අංශ ආරම්භ කිරීම පෙන්වා දිය හැකි ය.

- සන්නිවේදන අධ්‍යයනය, ශාස්ත්‍රීය විෂයයක් ලෙස ඉගැන්වීම ආරම්භ කළ පළමු විශ්වවිද්‍යාලය වන්නේ ඉලිනොයිස් විශ්වවිද්‍යාලය යි.

- 1960 දශකයේ මුල් භාගයේ දී සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව, මනෝ විද්‍යාව සහ ඉංග්‍රීසි භාෂාව ආදි විෂය ක්ෂේත්‍ර තුළ අන්තර්ගත ව තිබූ සන්නිවේදන අධ්‍යයනය ස්වාධීන විෂය ක්ෂේත්‍රයක් ලෙස වෙන ම අධ්‍යයනය කිරීම ආරම්භ විය.

- ජනමාධ්‍ය මඟින් ඉදිරිපත් වූ සන්දේශ සහ මාධ්‍යයන්ගේ ක්‍රියාකාරීත්වය ජන ජීවිතයේ සියලු දේ කෙරෙහි බලපෑම් ඇති කිරීමට හේතු වන බව 60, 70 දශකවල සන්නිවේදන ක්ෂේත්‍රයේ විද්වතුන් විසින් සිදු කරන ලද පර්යේෂණ, අධ්‍යයන මඟින් අනාවරණ කර ගන්නා ලදි.

- විශේෂයෙන් රූපවාහිනි මාධ්‍ය දරුවන් කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ මහාචාර්ය විල්බර් ශ්‍රාම් වැනි විද්වතුන් සහ විශ්වවිද්‍යාල පර්යේෂණ කණ්ඩායම් විසින් සිදු කරන ලද පර්යේෂණ අධ්‍යයනයන්හි අනාවරණ ගැඹුරින් සාකච්ඡාවට ලක් විය.

- මහාචාර්ය විල්බර් ශ්‍රාම් විසින් රූපවාහිනි මාධ්‍ය පිළිබඳ සිදු කරන ලද ප්‍රථම පර්යේෂණ වාර්තාව ඉදිරිපත් කරමින් ඔහු ප්‍රකාශ කර සිටියේ ළමයින්ගේ සමාජ සම්බන්ධතා දුරස් වීම හා රූපවාහිනි භාවිතය අතර සම්බන්ධතාවක් පවතින බවයි. දෙමව්පියන් සමඟ අඬදබර කරගන්නා දරුවන් තම නොරිස්සුම් සහගත හැඟීම්වලින් පලා යාමට, සිත් වේදනාවන් අමතක කර ගැනීමට රූපවාහිනිය නැරඹීමට යොමු වන බව තව දුරටත් වාර්තාවෙන් කරුණු ඉදිරිපත් කළේය.

- පෙන්සිල්වේනියානු විශ්වවිද්‍යාලය පර්යේෂණ කණ්ඩායම විසින් ප්‍රචණ්ඩ ක්‍රියා සහිත හා රහිත රූපවාහිනි කාටූන් වැඩසටහන් ළමයින් කණ්ඩායම් දෙකකට නැරඹීමට අවස්ථාව ලබා දී සිදු කළ පර්යේෂණය, මහාචාර්ය විල්බර් ශ්‍රාම් සිය පර්යේෂණ අධ්‍යයනය මඟින් ඉදිරිපත් කළ කරුණු තහවුරු කිරීමට සමත් විය.

- මෙහි දී පෙන්සෙල්වේනියානු විශ්වවිද්‍යාල පර්යේෂණ කණ්ඩායම විසින් රූපවාහිනියේ ප්‍රචණ්ඩ ක්‍රියා සහිත වැඩසටහන් නැරඹීම නිසා ළමයින් තුළ ප්‍රධාන වශයෙන් වෙනස්කම් තුනක් සිදු වන බව පෙන්වා දෙන ලදි.

    1. වේදනාත්මක දේ පිළිබඳ දරුවන්ගේ සංවේදිතාව අඩු වීම
    2. දරුවන් ඔවුන් ජීවත් වන පරිසරය හා අවට ලෝකය පිළිබඳ බියක් ඇති කර ගැනීම
    3. අන් අය සමඟ කටයුතු කිරීමේ දී ආක්‍රමණශීලී වන්නටත් ඉක්මනින් ආරවුල් ඇති කරගන්නටත් දරුවන් තුළ නැඹුරුව වැඩි වීම

- මාධ්‍ය මඟින් සමාජය වෙත සිදු කරනු ලබන බලපෑම අධ්‍යයනය කිරීම සම්බන්ධයෙන් සිදු කළ පර්යේෂණ අධ්‍යයන හේතුවෙන් සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය තව දුරටත් සංවර්ධනය විය.

- 1960 සහ 70 දශක වන විට ජනමාධ්‍ය විසින් සමාජ වෙත එල්ල කළ බලපෑම 80 සහ 90 දශකවල අංකිත තාක්ෂණික මාධ්‍ය මෙවලම් භාවිතයට පැමිණීම සහ වර්තමානය වන විට නව මාධ්‍ය, සමාජ මාධ්‍යවල ක්‍රියාකාරීත්වය සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රයේ විෂය පථය තව දුරටත් පුළුල් කිරීමට හේතු වී ඇත.

- සන්නිවේදනය විෂයය සජීව මෙන් ම සක්‍රිය විෂය ක්ෂේත්‍රයකි. සන්නිවේදන තාක්‍ෂණයේ නැඟීමත් සමඟ අතීතයේ සිට සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය වර්ධනය වී ඇත.
- එසේ ම වර්තමානයේ සහ අනාගතයේ ද මෙම විෂයය සන්නිවේදන තාක්‍ෂණයේ දියුණුව, නවීන සන්නිවේදන මෙවලම් හා ඒවා භාවිත කිරීමේ ස්වභාවය සහ එමඟින් සමාජය වෙත කරනු ලබන බලපෑම අනුව වෙනස් වේ.
- සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රයේ මෙම ස්වභාවය කෙරෙහි සිසු අවධානය යොමු කළ යුතු වන අතර එම හේතුවෙන් සන්නිවේදන ක්ෂේත්‍රයෙහි ඉදිරියට යාමට ජාතික හා ජාත්‍යන්තර තලයේ විවිධ අවස්ථා ගොඩනැඟී ඇති බව පිළිබඳ ඔවුන් දැනුවත් කළ යුතු වේ.

- සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය පිළිබඳ ශාස්ත්‍රීය වශයෙන් අධ්‍යයනය කිරීමෙන්,

  i. ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් සන්නිවේදන ක්‍රියාදාමය හා මාධ්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධය
  ii. විචාරශීලී ව මාධ්‍ය පරිහරණය කිරීමේ කුසලතා වර්ධනය
  iii. අවශ්‍ය, අදාළ තොරතුරු තෝරා ගැනීමේ හැකියාව
  iv. ගවේෂණශීලී භාවය, විචාරශීලි චින්තනය දියුණු වීම
  v. මාධ්‍ය සාක්ෂරතාව
  vi. යහපත්, ආචාරශීලී හා ඵලදායී මානව අන්තර් සම්බන්ධතා
  vii. සමාජ ප්‍රගමණය සඳහා සක්‍රිය දායකත්වය
  viii. නිර්මාණාත්මක චින්තනය හා මාධ්‍ය සන්දේශ නිර්මාණය
  ix. සංවර්ධනාත්මක හා ප්‍රජාතන්ත්‍රවාදී චින්තනයෙන් පෝෂණය වූ පුරවැසියෙකු වීමට අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා හා පුරුදු
  x. ජන මාධ්‍ය ආයතනයන්හි ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධය පුද්ගලයෙකු තුළ ගොඩනැංවේ.

ඇගයීම

1. සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය හා ශාස්ත්‍රීය විෂයයක් ලෙස එහි ආරම්භය විස්තර කරන්න.

2. සන්නිවේදනය ශාස්ත්‍රීය විෂයයක් ලෙස අධ්‍යයනය කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

3. සන්නිවේදනය ශාස්ත්‍රීය විෂයක් ලෙස වර්ධනය වීම කෙරෙහි මාධ්‍යයේ ක්‍රියාකාරිත්වය බලපෑ ආකාරය පිළිබඳ කරුණු රැස් කරන්න. ඒ සඳහා පහත දැක්වෙන කරුණු ඔස්සේ තොරතුරු රැස් කරන්න. එම තොරතුරු සුදුසු ක්‍රමවේද භාවිත කරමින් ඉදිරිපත් කරන්න.

   * කාර්මිකකරණය හා සන්නිවේදන මාධ්‍යයේ වර්ධනය
   * පළමුවන හා දෙවන ලෝක සංග්‍රාම හා මාධ්‍යයේ ක්‍රියාකාරිත්වය
   * ජනමාධ්‍ය බිහි වීම සහ එහි බලපෑම
   * අන්තර්ජාලය ඇතුළු අංකිත සන්නිවේදන තාක්ෂණ මාධ්‍ය මෙවලම්හි දියුණුව

4. සන්නිවේදනය ශාස්ත්‍රීය අධ්‍යයන ක්ෂේත්‍රයක් ලෙස වර්ධනය කිරීමට දායක වූ පෙර අපරදිග විද්වතුන් හා ඔවුන්ගේ කාර්යභාරය පිළිබඳ අධ්‍යයනය කර වාර්තාවක් සකස් කරන්න.

**නිපුණතා මට්ටම** : 1.2 ශ්‍රී ලංකාවට සන්නිවේදනය විෂයය හඳුන්වා දීම හා එයට පසුබිම් වූ සාධක පිළිබඳ අවබෝධය ලබයි.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල** : • ශ්‍රී ලංකාවට සන්නිවේදන අධ්‍යයනය හඳුන්වා දීම පිළිබඳ විස්තර කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්:**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න.

- සන්නිවේදන විෂයය ශ්‍රී ලංකාවට ප්‍රථම වරට හඳුන්වා දීම සිදු වන්නේ දෙහිවල කනිෂ්ඨ විශ්වවිද්‍යාලය (Junior Campus) මූලික වීමෙනි. වර්ෂ 1968 - 1969 කාලයේ දී ''පුවත්පත් කලාවේදය (Journalism)'' නමින් එහි පාඨමාලාවක් හඳුන්වා දෙන ලදි.
- ''පුවත්පත් කලාවේදය'' නම් වූ එම පාඨමාලාව සඳහා විෂය නිර්දේශය සකස් කරනු ලැබුවේ ආචාර්ය එඩ්වින් ආරියදාස විසිනි. එම පාඨමාලාව වසර දෙකකින් පසු අවලංගු වී ඇත.
- මේ සඳහා එවක අධ්‍යාපන ඇමති ධුරය දැරූ අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල මහතා මූලිකත්වය ගෙන කටයුතු කළේ ය.
- 1971 කැරැල්ලෙන් පසු විශ්වවිද්‍යාල සඳහා වෘත්තීය අභිමුඛ පාඨමාලා හඳුන්වා දීමේ දී සන්නිවේදනය විෂයය විශ්වවිද්‍යාල පද්ධතියට හඳුන්වා දී ඇත.
- ඒ අනුව 1973 වසරේ දී කැලණිය විශ්වවිද්‍යාලයේ ''ජනසන්නිවේදන අධ්‍යයන අංශය'' යනුවෙන් නව අධ්‍යයන අංශයක් ප්‍රථම වරට ආරම්භ කරන ලදි.
- මේ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද මහාචාර්ය විමල් දිසානායක, මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර, මහාචාර්ය එම්.බී. ආරියපාල, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර, ආචාර්ය එඩ්වින් ආරියදාස සහ ඩී. සී. රණතුංග ඇතුළත් විද්වත් කමිටුව විසින් ප්‍රමුඛත්වය ගන්නා ලදි.
- මහාචාර්ය විමල් දිසානායක සහ මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර විෂයය ඉගැන්වූ ප්‍රථම කථිකාචාර්යවරු වූහ. බාහිර කථිකාචාර්යවරු ලෙස ආචාර්ය එඩ්වින් ආරියදාස, ආචාර්ය පියසෝම මේදිස්, ඩී. බී. නිහාල්සිංහ, කේ. ජයතිලක, මහගම සේකර, ඩබ්ලිව්. ඩී. අමරදේව, ඩී. සී. රණතුංග සහ පියසිරි ගුණරත්න යන විද්වත්හු කටයුතු කළහ.
- මෙයට සමගාමී ව 1972 වසරේ දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ද ''පුවත්පත් කලාව'' යනුවෙන් ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කර ඇත. වසරකින් පමණ පසු එම පාඨමාලාව නවතා දමා ඇත.

- එමෙන් ම 60 දශකයේ ලංකාවේ පැවති ලංකා ගුවන්විදුලි සේවය මඟින් හා ලේක්හවුස් ආයතනය මඟින් වෘත්තීය මාධ්‍යවේදීන් සඳහා පුහුණු පාඨමාලා පවත්වා ඇත.
- වර්තමානය වන විට සන්නිවේදන විෂයය පිළිබඳ පාඨමාලා කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, කොළඹ විශ්ව විද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපය, රජරට විශ්වවිද්‍යාලය, විවෘත විශ්වවිද්‍යාල, නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපය සහ යාපනය විශ්වවිද්‍යාලය වැනි විශ්වවිද්‍යාල මඟින් ක්‍රියාත්මක කරනු ලබයි.
- ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාල රැසක ව්‍යාප්ත ව තිබෙන මෙම විෂයය සහතික පත්‍ර, ඩිප්ලෝමා, සාමාන්‍ය උපාධි, විශේෂ උපාධි, පශ්චාත් උපාධි, සහ ආචාර්ය උපාධි පාඨමාලා දක්වා අධ්‍යයනය කළ හැකි පාඨමාලා ලෙස ඉතා සංවර්ධිත මට්ටමකට පැමිණ තිබේ.
- ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2006 වර්ෂයේ දී ප්‍රථම වරට 10 වන ශ්‍රේණියටත් 2007 වර්ෂයේ දී 11 වන ශ්‍රේණියටත් අතිරේක විෂයයක් ලෙස ''සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය'' විෂයය හඳුන්වා දී ඇති අතර 2008 වර්ෂයේ සිට උසස් පෙළ කලා විෂය ධාරාවට ද සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය ඇතුළත් කර තිබේ.
- වර්තමානයේ සන්නිවේදන අධ්‍යයනය හා ඒ සම්බන්ධ ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය වන පරිදි සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ මාධ්‍යයන්ගෙන් ප්‍රායෝගික හා න්‍යායාත්මක අන්තර්ගතයන් සහිත පාඨමාලා රැසක් පෞද්ගලික ආයතන මට්ටමෙන් ද ක්‍රියාත්මක වෙමින් පවතී. මේ අනුව සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රයන්හි වෘත්තීය අවස්ථා පුළුල් වීමක් ද දැක ගත හැකි ය.
- සන්නිවේදනය සෑම වෘත්තියක ම සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය විෂයයක් වී ඇති බැවින් ඒ පිළිබඳ හැදෑරීම හා ප්‍රගුණ කිරීම වර්තමානයේ දී ඉතා වැදගත් හා ප්‍රයෝජනවත් වේ.

ඇගයීම

1. ශ්‍රී ලංකාවට සන්නිවේදන අධ්‍යයනය හඳුන්වා දීම පිළිබඳ විස්තරයක් කරන්න.
2. ශ්‍රී ලංකාවේ සන්නිවේදන විෂය ක්ෂේත්‍රයෙහි ඇති ව තිබෙන සංවර්ධනය හා එය ඉගෙනීමෙහි වැදගත්කම සාකච්ඡා කරන්න.
3. ශ්‍රී ලංකාවේ සන්නිවේදනය විෂයය උගන්වනු ලබන විශ්වවිද්‍යාල, ජනමාධ්‍ය ආයතන නිරීක්ෂණය කරන්න. එහි දී ඔබ ලබාගත් තොරතුරු අනුව ඔබට ඉදිරියට ප්‍රවේශ විය හැකි දේශීය සහ විදේශීය අධ්‍යයන ක්ෂේත්‍ර, විෂයය දැනුම පෝෂණය කිරීමට උපකාර ලබා ගත හැකි බාහිර සම්පත් පුද්ගලයන්, ආයතන ආදී කරුණු පිළිබඳ විමර්ශනය කරන්න.
4. ශ්‍රී ලංකාවේ සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය වර්ධනය කිරීමට පුරෝගාමී වූ සිංහල, දෙමළ චරිතාපදාන අධ්‍යයනය කරන්න.

**නිපුණතා මට්ටම** : 1.3 සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය ශාස්ත්‍රීය විෂයයක් ලෙස ඉගෙනීමෙහි අවශ්‍යතාව පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 07 යි.

**ඉගෙනුම් පල** :

- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හඳුන්වා දෙයි.
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හැදෑරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්:**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න.

- ප්‍රාථමික පාසලේ සිට විශ්වවිද්‍යාල මට්ටම දක්වාත් වැඩිහිටි අධ්‍යාපනයෙහි සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යාපනය පිළිබඳ වැඩසටහන් ආරම්භ කරමින් ප්‍රචලිත කරන ලෙස 1982 වසරේ යුනෙස්කෝ සංවිධානය ගෲන්වල්ට් ප්‍රකාශයෙන් කළ නිර්දේශයන් පදනම් කොට ගෙන 2006 වසරේ සිට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය පළමු ව 10 සහ 11 ශ්‍රේණි සඳහා අතිරේක විෂයයක් ලෙසත් 2008 සිට අ.පො.ස. (උසස්. පෙළ) කලා විෂය ධාරාවටත් හඳුන්වා දී ඇත.
- ''මාධ්‍ය අධ්‍යාපනය'' යන්න ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳ අවධානයට ගනු ලබන පුළුල් විෂය ක්ෂේත්‍රයකි.
- මාධ්‍ය අධ්‍යාපනය යනු පුද්ගලයා මාධ්‍ය සාක්ෂරතාවෙන් යුක්ත අයෙකු බවට පත් කර ලීමේ ක්‍රියාවලිය යි. මාධ්‍ය අධ්‍යාපනය සමස්තයක් ලෙස සියලු ම මාධ්‍ය කෙරෙහි අවධානය යොමු කරයි.
- ''සියලු ම මාධ්‍ය'' යන්නට චලන රූප ඇතුළත් චිත්‍රපට, රූපවාහිනිය, වීඩියෝ පට ආදි සියල්ලත් හඬ මාධ්‍යයට ඇතුළත් ගුවන් විදුලිය, පටිගත කරන ලද සංගීතය ඇතුළත් සියල්ලත්, මුද්‍රිත මාධ්‍යයන්ට සම්බන්ධ පුවත්පත්, සඟරා, පෝස්ටර ආදියත්, නව අංකිත තාක්ෂණය භාවිතයට ගන්නා සියලු මාධ්‍යත් ඇතුළත් වේ.
- යුනෙස්කෝ සංවිධානය පාසලේ ප්‍රාථමික ශ්‍රේණියේ සිට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යාපනය ලබා දිය යුතු බවට නිර්දේශ කරන ලද්දේ මේ ආකාරයෙනි.

*''එයින් සමාජයට මුද්‍රිත මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍ය විචාරශීලී ව පරිහරණය කිරීමට අවශ්‍ය දැනුම, කුසලතා, ආකල්ප පෝෂණය කළ හැකි බවත් එය ජීවත් වීම සඳහා අත්‍යවශ්‍ය නිපුණතාවක් වන බවත් මාධ්‍ය අධ්‍යාපනය ලබා දීම සඳහා සකස් කරනු ලබන වැඩසටහන්වල මාධ්‍ය නිෂ්පාදනයන් සම්බන්ධ විවරණයන්, නිර්මාණශීලී ආවේදනයන් පළ කිරීමේ මාධ්‍යයක් ලෙස ජනමාධ්‍ය භාවිත කළ හැකි ආකාරයන්, ඵලදායි ලෙස මාධ්‍ය පරිහරණය කිරීම හා සක්‍රිය අයුරින් මාධ්‍ය වැඩසටහන්වලට සහභාගි වීම යන කරුණු පිළිබඳ ව අන්තර්ගත කළ යුතු බවත් ය. ''*

- යුනෙස්කෝ සංවිධානය විසින් පාසල් විෂය ධාරාවට මාධ්‍ය අධ්‍යාපනය විෂයය ඇතුළත් කළ යුතු බව සඳහන් කරන ලද්දේ මෙම කාල වකවානුව වන විට (1980 දශකය) ජනමාධ්‍යයන්ගේ ක්‍රියාකාරිත්වය ළමා හා තරුණ පරපුර කෙරෙහි ඇති කරන ලද අහිතකර බලපෑම ප්‍රබල වී තිබීම හේතුවෙනි.

- වර්තමානයේ අපරිමිත මාධ්‍ය තාක්ෂණික මෙවලම් ඔස්සේ සිදු වන වේගවත් තොරතුරු ගලනය අසීමාන්තික හා විචිත්‍රවත් මාධ්‍ය ආකෘති, අප්‍රමාණ මාධ්‍ය පරිභෝජනය හමුවේ මාධ්‍ය භාවිතයෙන් පුද්ගලයා වළක්වා තබනු වෙනුවට, තර්ජනය කර සීමා කරනු වෙනුවට මාධ්‍ය පරිහරණය කිරීමට අවශ්‍ය නිසි දැනුමෙන් ඔහු සන්නද්ධ කර සූදානම් කළ යුතු බවට ලෝක මතයක් ගොඩනැගෙනුයේ මෙම යුනෙස්කෝ ප්‍රකාශනයත් සමඟිනි.

- මාධ්‍ය අධ්‍යාපනය යන පුළුල් විෂය ක්ෂේත්‍රය මඟින් විචාරශීලී ව මාධ්‍ය පරිහරණය කිරීමට අවශ්‍ය ශික්ෂණයත් එයින් මාධ්‍ය සාක්ෂරතාව වර්ධනය කර ගැනීමටත් මඟ පෙන්වනු ලබයි.

- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය උගන්වන ගුරු භවතුන් මෙන් ම විෂයය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යයාවන් ද පාසල් මට්ටමට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යාපනය විෂයය හඳුන්වා දීමේ පසුබිම පිළිබඳ අවබෝධයෙන් යුක්ත වීම ඉතා වැදගත් වේ.

- අ.පො.ස. උසස් පෙළට නියමිත මෙම සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය කොටස් දෙකකින් සමන්විත ය.

    1. සන්නිවේදනය
    2. මාධ්‍ය අධ්‍යයනය

- එහි දී ''සන්නිවේදනය'' යන විෂය කොටසේ දී සන්නිවේදනය පිළිබඳ නිර්වචන, සන්නිවේදනයේ පදනම, කාර්යභාරය, විවිධ සන්නිවේදන වර්ග, ආකෘති ආදි සන්නිවේදනය පිළිබඳ න්‍යායාත්මක කරුණු හා ඒවා ප්‍රායෝගික ව භාවිත කිරීමේ කුසලතා පිළිබඳ අවධානය යොමු කෙරේ.

- මාධ්‍ය අධ්‍යයනය යන විෂය කොටසේ දී මාධ්‍ය පිළිබඳ ව ඉගෙනීම, හැදෑරීම, මාධ්‍යයේ ස්වභාවය, අන්තර්ගතය, ඓතිහාසික පරිණාමය, ක්‍රියාකාරිත්වය හඳුනා ගැනීම මෙන් ම මාධ්‍ය පුද්ගලයාට සමාජයට සංස්කෘතියට බලපාන ආකාරය පිළිබඳ ව හැදෑරීම සිදු වේ.

- ''සන්නිවේදනය'' මානව අන්තර් සම්බන්ධතා පැවැත්වීමේ අත්‍යවශ්‍ය ම සහ ප්‍රමුඛතම මෙවලමක් ලෙස හඳුනාගත හැකි ය. එබැවින් සන්නිවේදන කුසලතාව සෑම අයෙකු ම සතු විය යුතු සහ ප්‍රගුණ කළ යුතු හැකියාවක් වන බව අවධානයට ගත යුතු වේ.

- මාධ්‍ය අධ්‍යයනය මඟින් විචාරශීලීභාවයෙන් යුතු ව මාධ්‍ය පරිහරණය කිරීමට අවශ්‍ය අවබෝධය සහ ශික්ෂණය ලබා දේ. එයින් මාධ්‍ය සාක්ෂරතාව වර්ධනය වේ.

- ප්‍රාථමික සමාජවල ජීවත් වූ මානවයන් භාවිතයට ගත් ශබ්ද, සංඥා, සංකේතයන්ගේ සිට ජනමාධ්‍යන් වර්ධනය වීමත් වර්තමානය වන විට අංකිත තාක්ෂණික මාධ්‍ය මෙවලම් දක්වා වර්ධනය වූ සන්නිවේදන ක්‍රියාදාමයත් සමාජය කෙරෙහි බලපෑම් ඇති කරයි.

- යහපත් සන්නිවේදකයෙකු මෙන් ම පුරවැසියෙකු වීමට අවශ්‍ය සන්නිවේදන ඥානයත් විචාරශීලී ව මාධ්‍ය පරිහරණය කිරීමේ ශික්ෂණයත් දරුවන් තුළ වර්ධනය කිරීම අවශ්‍ය වේ.
- ඒ අනුව සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හැදෑරීමේ අවශ්‍යතාව

  * සන්නිවේදන කුසලතා වර්ධනය
  * මාධ්‍ය සාක්ෂරතාව
  * විචාරශීලී මාධ්‍ය පරිහරණය
  * අවස්ථෝචිත භාෂා භාවිතය
  * මාධ්‍ය හා සංස්කෘතිය පිළිබඳ අවබෝධය
  * මාධ්‍යයේ පුද්ගල හා සමාජ බලපෑම
  * තොරතුරු පරිහරණය කිරීමේ අවබෝධය
  * මාධ්‍ය ආචාර ධර්ම හා නියාමනය පිළිබඳ අවබෝධය
  * යහපත් පුරවැසියෙකු ලෙස සංවර්ධනයට දායක වීම
  * නිර්මාණශීලී සන්නිවේදන කුසලතා ආදි කරුණු ඔස්සේ විග්‍රහ කිරීම අවශ්‍ය වේ.

**ඇගයීම**

1. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයයෙහි අවධානයට ගන්නා විෂය ක්ෂේත්‍ර පැහැදිලි කරන්න.
2. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හැදෑරීමේ අවශ්‍යතාව විචාරාත්මක ව විග්‍රහ කරන්න.

**පාරිභාෂික පද**

1. ගෘන්වල්ට් ප්‍රකාශනය - Grunwald Declaration
2. මාධ්‍ය අධ්‍යයනය - Media Studies
3. මාධ්‍ය අධ්‍යාපනය - Media Education
4. සන්නිවේදනය - Communication

**ආශ්‍රිත ග්‍රන්ථ හා ප්‍රකාශන**


1. දිසානායක, විමල්, **මානව සන්නිවේදනය**, කොළඹ, සීමාසහිත ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම, 1977
2. De Fleur and Dennis, *Understanding Mass Communication*, Boston, USA, Houghton Mifflin Company, 1991.
3. James Waston and Anne Hill, *A Dictionary of Communication and Media Studies*, India, Universal book stall, 1991
4. Roger s, Everett M., *A History of Communication Study*, New York: The free press. 1994
5. *UNESCO Declaration on Media Education*, International Symposium on Media Education, Grunwald, Federal Republic of Germany, 22 January, 1982